# තේලකටාහ ගාථා

(කල්‍යාණ නම් රහතන් වහන්සේ උණු තෙල් කටාරමේ වැඩ සිටිමින් කළ අනුශාසනාව.)

ධර්මදානය පිණිසයි

සංස්කරණය

පූජ්‍ය බද්දේගම වජිරනන්ද හිමි

# තේලකටාහ ගාථා

ප්‍රථම මුද්‍රණය 2024

සංස්කරණය - පූජ්‍ය බද්දේගම වජිරනන්ද හිමි

**ධර්ම දානය පිණිස පමණි.**

**ප්‍රකාශනය**

දිමුතු ප්‍රකාශන ආයතනය

අංක 103/A, නුවර පාර, යක්කල.

දුරː 033-2239662 / 077-8829705

විද්‍යුත් තැපැලː dimuthupub@yahoo.com

දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.

වෙබ්ː www.dhammadanabooks.com

**ධර්මදානය සඳහා මුද්‍රණ විමසීම්**

දිමුතු ප්‍රකාශන ආයතනය

අංක 103/A, නුවර පාර, යක්කල.

දුරː 033-2239662 / 077-8829705

නියෝජිත - අතුල ප්‍රියංකර

0726319100 - 0701000136

**මුද්‍රණ සේවා සැපයීම**

ආර්.කේ ප්‍රින්ටර්ස්

223/C, ඉහල යාගොඩ, ඉඹුල්ගොඩ.

# පෙරවදන

පෙර ලක්දිව කල්‍යාණ නම් රහතන් වහන්සේ ඉහත ආත්ම භාවයකදී කුඩා මැස්සකු උණුකිරි බඳුනක ගිල්වා මැරීමේ අකුසල විපාකයක් නිසා තෙල් කටාරමක ගිලී මරණයට පත්වන්නට සිදුවූ මොහොතේදී සංවේගය උපදවා අවවාදාත්මක ගාථා සියයක් දේශනා කොට පිරිනිවනට පත් විය. එම ගාථා සියය "තේලකටාහ ගාථා" නමින් සංග්‍රහ වී තිබුනත් ඒවා එතරම් ජනගත වී නැති බව නම් පැහැදිලිය. ඒ පිලිබඳව ලියවුනු පොත පතද දුර්ලභය. මා දන්නා තරමින් අතිපූජනීය බලංගොඩ ආනන්ද මෛත්‍රී මහතෙරුන් වහන්සේ විසින් රචිත පොතක් සහ මෑත කාලයේදී මහත්වරු කීප දෙනෙක් එකතුවී සංස්කරණය කරනලද පොතක් ද මුද්‍රණය වී තිබේ. එහෙත් අර්ථ රසයෙන් ධර්ම රසයෙන් පිරිපුන් එම ගාථා සියය ගැන අපගේ අවධානය යොමු වූයේ මෑතකදී නාඋයන ආරණ්‍ය සේනාසනයේ වැඩසිටි තරුණ ස්වාමීන් වහන්සේලා දෙනමක් වන පූජ්‍ය මාවතගම විනයසෝභන සහ පූජ්‍ය හොරොව්පතානේ විමලකිත්ති යන ස්වාමීන් වහන්සේලා එකතුවී තේලකටාහ ගාථා සහ ඒවායේ සරල අර්ථ සහිතව ලයාන්විත ස්වරයකින් සජ්ඣායනාවක් සකස් කර තිබීම නිසාය. එම සජ්ඣායනාව නිතර ශ්‍රවනය කල මා හට එය පොතක් ලෙස මුද්‍රණය කරන්නට හැකි නම් තවත් බොහෝ දෙනාට ප්‍රයෝජනවත් වේ යයි යන හැඟීම ඇතිවිය. ඒ අනුව අප දැනට මුද්‍රණය වී ඇති පොතපතද පරිශීලනය කරමින් පාලි ගාථා හා තේරුම් සරලව නිවැරදිව ඉදිපත් කරන්නටත් ගාථාවේ පාලිපාඨ වල අදහසට හානියක් නොවන සේ සකස් කරන්නටත් හැකිතාක් උත්සාහ කළෙමු. එබැවින් මෙහි ඇතැම් තැන් වල තේරුම

තේරුම් ගැනීමට අපහසු වන්නට පුළුවන. එසේම තව දුරටත් මෙහි බොහෝ අඩුපාඩු ද තිබිය හැකිය. ඒ ගැන සමාව භජනය කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු. එසේම මෙම පොතට අදාල එම සජ්ඣායනාව පොතට ඇතුලත් කර ඇති කේතය ස්කෑන් කරගැනීමෙන් අන්තර්ජාලය හරහා ශ්‍රවණය කිරීමට හැකිය.

නාඋයන ආරණ්‍ය සේනාසනවාසී අපගේ ආචාර්යයෝත්තම අතිපූජනීය මීගොඩ සඞ්ඝසෝභන මාහිමිපාණන් වහන්සේගේ 2024-12-28 ට යෙදෙන 92 වන ජන්ම දිනය නිමිති කරගෙන මාහිමිපාණන් වහන්සේට නිරෝගීසුව දීර්ඝායුෂ ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මෙම ග්‍රන්ථය මුද්‍රණය කරවා ධර්ම දානයක් වශයෙන් බෙදා දෙන්නට අපට සිත්විය.

අපගේ එම අදහස මල් ඵල ගැන්වීමෙහිලා ප්‍රමුඛතම කාර්යභාරයක් වන පොත මූලිකව පිටපත සකස් කර දුන් පූජ්‍ය ගල්පොතුගොඩ ඤාණවංස ස්වාමීන් වහන්සේටත් සෝදුපත් බැලීමේදී උදව් කල පූජ්‍ය බියගම ධම්මරතන ස්වාමීන් වහන්සේ ඇතුළු නන් අයුරින් උදව් කළ සියළු දෙනාටත් මුද්‍රණ දායකත්වය දැරූ සියළුම දායක දායිකාවන්ටත් දරු දැරියන්ටත් නිසි ලෙස පොත මුද්‍රණය කර දුන් දිමුතු මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් පහසුවෙන්ම ධර්මාවබෝධය පිණිස මෙම ධර්මදානමය කුසලය හේතු උපනිශ්‍රය වේවා!

සියළු සත්වයෝ සුවපත් වෙත්වා!

මෙයට, මෙතැති,
පූජ්‍ය බද්දේගම වජිරනන්ද හිමි

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!

# තේලකටාහ ගාථා

## නිධාන කථාව සහ අනුශාසනාව

පෙර ලංකාද්වීපයේ කැළණිතිස්ස නම් සැදැහැති රජ කෙනෙක් විය. රජුගේ බාල සොහොයුරු වූ උත්තිය නම් කුමරු යුවරජ තනතුරෙහි සිටියේය. උත්තිය කුමරු රජුගේ මෙහෙසිය සමග අනියම් සබඳතාවයක් ඇතිකර ගත්තේය. එය රජු දැනගත් බව දැන ඔහු බියෙන් පලා ගොස් සැඟවී සිට අතවැසියකුට සිවුරු හඳවා භික්ෂුවක ලෙස වෙස් ගන්වා රජ බිසවට දෙන ලෙස හසුනක් දී පිටත් කරහැරියේය. එකල රජු සමග බොහෝ කුළුපග කල්‍යාණ නම් මහතෙරුන් වහන්සේ නමක් දිනපතා රජ ගෙදරට දානයට වඩියි. භික්ෂු වෙස් ගත් අතවැසියා හසුන ගෙන කල්‍යාණ නම් මහතෙරුන් වහන්සේ රජගෙදර දානයට වඩින අවස්ථාවේ පිටුපසින් ගියේය. මහතෙරනුවෝ ද ඒ රාජ කුළුපග භික්ෂුවකැයි සිතුවේය. රජතුමා ද ඒ මහ තෙරුන්ගේ අතවැසි නමකයි සිතුවේය. දන් වළඳා ආපසු වඩින අවස්ථාවේ භික්ෂු වෙස් ගත් අතවැසියා රජතුමාට නොපෙනෙන සේ බිසව සමීපයේදී හසුන බිමට දැමුවේය. එහෙත් එය බිමට වැටුනු ශබ්දය ඇසී රජතුමා එය රැගෙන බලා එම අකුරු කල්‍යාණ මහතෙරුන්ගේ යයි වරදවා සිතා කෝපයට පත්ව මහතෙරුන් වහන්සේ උතුරන තෙල් සැළියක දමා මරන්නට අණ කළේය. රාජපුරුෂයන් විසින් මහතෙරුන් වහන්සේ උතුරන තෙල් සැළිය සමීපයට ගෙන ගියේය. මහතෙරුන් වහන්සේ තෙල් සැළියට දමන්නට ප්‍රථමවම විදසුන් වඩා අරිහත්වයට පැමිණ කිසිඳු පැකිලීමක්

නැතිව එම තෙල් සැළියට බැස පියුම් විලකට බට ස්වර්ණ හංස රාජයෙකු සේ අරිහත්වයේ ආනුභාවයෙන් රෝම කූපයක් පවා නොදැවී තෙල් සැලියේ ම වැඩ සිට මෙවන් විපාකයට තමාට මුහුණ පාන්නට සිදුවූයේ ඇයිදැයි අතීතය සම්මර්ෂනය කළ සේක. එසේ කිරීමේදී තමා ගොපලු දරුවකු ලෙස ඉපිද කිරි උණුකරන අවස්ථාවකදී එයට වැටුණු මැස්සකු කෝපයෙන් කිරි එකේම ගිල්වා මරණයට පත්කල අකුසලයෙන් නිරයේ දුක්විඳ අනතුරුව ශේෂ විපාක වශයෙන් ආත්මභාව පන්සියයක් මෙලෙස තෙල් කටාරමක ගිලී මරණයට පත්වන්නට සිදුවූ බව දැක සංවේග උපදවා ගාථා සියයකින් රජුට අවවාද කොට පිරිනිවනට පත්වූ සේක.

එහිදී එයින් කෝපයට පත් දෙවියන් විසින් ජලය කැලතීම නිසා මුහුද ගොඩගැලූ බවත්, එම ව්‍යසනයෙන් මිදීම සඳහා විහාරමහා දේවිය මුහුදට බිලිකළ බවත් ලඞ්කා ඉතිහාසයේ සඳහන් වේ.

කුඩා මැස්සකු මැරීම මෙතරම් බරපතල විපාක ගෙන දුන්නේ නම් මෙකල දිනපතා සිදුවන කෝටි ප්‍රකෝටි ගනන් සත්ව ඝාතන වල විපාක කොතරම් විඳින්නට සිදුවන්නේද යයි සිතා ගැනීමටවත් බැරිය. එහි බරපතළ බව එපමණක්ම නොවේ. එම මහතෙරුන් වහන්සේ ආත්ම භාව පන්සියයක්ම මේ ආකාරයෙන්ම මරණයට පත් කරන්නට බොහෝ පිරිසක් සම්බන්ධ විය. ඒ සැම දෙනාම මැස්සකු මැරීමට වඩා බරපතළ අකුසල් කර ගත්තේය. ඒවායේ විපාක තව කොපමණ කාලයක් ඒ අයට විඳින්නට සිදුවේද? ඒ අය විපාක විඳින විට තවත් අය එවැනිම අකුසල් රැස් කර ගනිති.

මෙසේ එකම අකුසලය සසර කිසිදා අවසන් නොවන සේ සංසාර ගත වන බව පැහැදිලි වේ.

"කම්මා විපාකා වත්තන්ති-විපාකො කම්ම සම්භවො
තස්මා පුනබ්බවො හොති -එවං ලොකො පවත්තති"

යනුවෙන් කර්ම නිසා විපාක ඇතිවන බවත් විපාක විඳීමේදී නැවත කර්ම සිදුවී භවයන් හටගන්නා බවත් එයින් ලෝකයේ (සසර) පැවැත්ම සිදුවන බවත් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට තිබේ.

තවද මෙහිදී "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි" යන බුද්ධ වචනයට අනුව මැස්සකු වැනි කුඩා සතෙක් වුවද මරණ චේතනාවක් ඇතිවම ක්‍රියාව සිදුකල නිසා කර්ම පථ සකස් වී මෙසේ දරුණු විපාක විඳින්නට සිදුවූ බව දත යුතුය. සතුන් මරණ චේතනාවක් නැතිව කරන වත්පිළිවෙත් ගොවිතැන් ආදී කටයුතු වලදී සතුන් මරණයට පත් වීමෙන් කර්මපථ සකස් නොවේ.

එහෙත් චේතනාව ඇතිව අද කාලයේ මොන තරම් සත්ව ඝාතන මනුෂ්‍ය ඝාතන සිද්ධ වන්නේද? ප්‍රාණඝාත පමණක් නොව සොරකම, කාම මිත්‍යාචාරය, බොරුකීම, සුරාපානය ආදී පස් පවු දස අකුසල් මොන තරම් සිද්ධ වන්නේද? ඒවායේ අකුසල් විපාක කවදා නිම වන්නේද?

මේ තේලකටාහ ගාථා වලින් එම කල්‍යාණ මහතෙරුන් වහන්සේ පුන පුනා දේශනා කරන්නේ සසර දුක පිණිස හේතුවන පස් පව් දස අකුසල් වලින් වැළකී අප්‍රමාදීව දානාදී පුණ්‍ය කර්ම හා සීලාදී පිළිවෙත්හි යෙදෙන ලෙසයි.

මහතෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරාර්ථචර්යාව ආදර්ශයක් කරගෙනම පිළිවෙත් පිරූ

බව අවසානයේ දැක්වෙන මෙම 97 වෙනි ගාථාවෙන් මොනවට පැහැදිලි වෙයි.

> ඔහාය සො'ධිගත-මොක්ඛසුඛං පරෙසං
> අත්ථාය සංචරි භවෙසු මහබ්භයෙසු
> එවං සඳ පරහිතං පුරතො කරිත්වා
> ධම්මො මයානුචරිතො ජගදත්ථමෙව

"ඒ සර්වඥ තෙම අතට පත් නිවන්සුව හැර මහ බිය උපදවන භවයන්හි ඉපදී යම් පරාර්ථ චර්යාවක් කළේ ද, මෙසේ මා විසින් හැමකල්හිම පරාර්ථය ම පෙරදැරි කොට ලෝකයාට හිතවැඩ පිණිස ධර්මයෙහි ම හැසිරෙන ලදී."

ඒ නිසා සත් පුරුෂයිනි, තමාගේත් අනුන්ගේත් යහපත පිණිස සිල්ගුණදම් රකිත්වා! කෙනෙකු සිල්වත් වූ මොහොතේ සිටම ඔහු වෙතින් සංසාර ගත වන අකුසල් කිරීම නවතී. කෙනෙකු සිල්වත් වූ මොහොතේ සිටම ඔහු දුගතියට නොයන කෙනෙක් බවට පත්වේ. අතීතයේ සිදුවූ අකුසල් ගැන පසු තැවීම නිෂ්ඵල ක්‍රියාවකි. සිල් රැකීම තමාට පමණක් නොව සියළු සත්වයන්ටම මහත් සැනසිල්ලකි. අස්වැසිල්ලකි. කෙනෙක් සිල් රැකීමම පරාර්ථ චර්යාවකි. ඒ නිසා සියල්ලෝම කල්‍යාණ මහතෙරුන් වහන්සේගේ මෙම තේල කටාහ ගාථා කියවා ඒවායේ ඇති අවවාදයන් මුදුනින් පිළිගෙන ඒ අනුව දාන සීල භාවනා ආදී කුසලයෙහි අප්‍රමාද වී සසර දුකින් මිදෙත්වා!

සාධූ! සාධූ! සාධූ!

# ජේලකටාහ ගාථා

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස!!!

**1. ලද්ධිස්සරො ජයතු වාරණරාජගාමී**
**භොගින්දභොග රුචිරායත පීණ බාහු**
**සාධූපචාරනිරතො ගුණසන්නිවාසො**
**ධම්මෙ ඨිතො විගතකොධ-මදාවලෙපො**

හස්තිරාජයෙකු බඳු ලීලෝපේතව ගමන් ඇත්තා වූ නාගරාජයෙකුගේ දරණවැලක් මෙන් දික් වූ සිත්කළු පිරුණු බාහු යුග්මයක් ඇති දානාදී සත් කටයුත්තේ ඇලුණු ශාන්ති ක්ෂමෝපාදී ගුණයන්ට වාසස්ථානයක් වූ ධර්මයේ පිහිටියේ ද්වේෂය දුරුකළ මද දර්ප ගැවී නැති ලක් රජ තෙමේ බොහෝ කාලයක් සැපෙන් දිනේවා.

**2. යො සබ්බලොකමහිතො කරුණාධිවාසො**
**මොක්ඛාකරො රවිකුලම්බර පුණ්ණ චන්දො**
**ඤෙය්‍යොදධිං සුවිපුලං සකලං විබුද්ධො**
**ලොකුත්තමං නමථ තං සිරසා මුනින්දං**

සියලු ලෝක වාසීන් විසින් පුදන ලද්දේ ද, කරුණාවට වාසස්ථානය ද, මෝක්ෂයට උප්පත්ති ස්ථානය ද, සූර්යවංශ නැමති අහසට පුරසඳක් බඳු වේ ද, අතිශය මහත් වූ සියලු ඤෙය්‍ය මණ්ඩලය අවබෝධ කළේ ද, ලෝකෝත්තම වූ ඒ මුණීන්ද්‍රයන් වහන්සේ සිරසනමා වන්දනා කරවු.

**3. සොපානමාලමමලං තිදසාලයස්ස**
**සංසාර සාගරසමුත්තරණාය සෙතුං**
**සබ්බාගතීභය විවජ්ජිත ඛෙම මග්ගං**
**ධම්මං නමස්සථ සදා මුනිනා පණීතං**

දෙව්ලොව යාමට ඉණිමං පෙළක් බඳු වූ නිර්මල වූත් සසර සයුරෙන් එතෙර වන්නට හෙයක් (ඒදණ්ඩක්) බඳු වූ ද, සියලු අපාය භයින් මිදුනු ක්ෂේම මාර්ගයක් වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය සැමදා  වන්දනා කරවු.

**4. දෙය්‍යං තදප්පමපි යත්ථ පසන්න චිත්තා**
**දත්වා නරා ඵලමුළාරතරං ලභන්තෙ**
**තං සබ්බදා දසබලෙනපි සුප්පසත්ථං**
**සඞ්ඝං නමස්සථ සදාමිතපුඤ්ඤඛෙත්තං**

යම් සඟ රුවනක් කෙරෙහි පහන් සිත් ඇති මනුෂ්‍යයෝ ස්වල්ප වූ ද, ආහාර පානාදී දෙය්‍ය ධර්මයන් දී ඉතා මහත් කුසල විපාක ලබත් ද, දස බලධාරී වූ බුදුරජාණන් වහන්සේ විසින් මොනවට පසස්නා ලද දායකයන්ට මහත් විපාක ගෙනදෙන  හෙයින් අප්‍රමාණ පින් කෙතක් වූ ඒ අෂ්ඨාර්ය පුද්ගල මහා සඞ්ඝ රත්නය වන්දනා කරවු.

**5. තෙජො බලෙන මහතා රතනත්තයස්ස**
**ලොකත්තයං සමධිගච්ඡති යෙන මොක්ඛං**
**රක්ඛා න චත්ථි ච සමා රතනත්තයස්ස**
**තස්මා සදා භජථ තං රතනත්තයං භො**

පින්වත්නි, යම් හෙයකින් තෙරුවන් සම්බන්ධ තේජෝ ශක්තිය හේතුකොට ගෙන තුන්ලෝ වැසි සත්ව තෙමේ සංසාර විමුක්තියට මනාකොට පැමිණේ ද,  එම තුණුරුවන හා සම වෙනත් ආරක්ෂාවක් ලොව

කොතැනකවත් නැත්තේ ම ය. එබැවින් එම තුණුරුවන සැමදා සේවනය කරවු.

**6. ලඞ්කිස්සරො පරහිතෙක රතො නිරාසො
රත්තිම්පි ජාගරරතො කරුණාධිවාසො
ලොකං විබොධයති ලොකහිතාය කාමං
ධම්මං සමාචරථ ජාගරියානුයුත්තා**

පරාර්ථචර්යාවෙහි අතිශයින් ම නිරත වූ, ආසා රහිත වූ, රැයෙහි ද නිදිවර්ජිත කිරීමෙහි ඇලුණු, කරුණාවට ආධාර වූ ලංකේශ්වර රජුතෙමේ ලෝකයාට හිත වැඩ පිණිස ඒකාන්තයෙන් ලෝ වැසියා ප්‍රබෝධ කෙරේ. තෙපි ද නිදිවර්ජිත කිරීමෙහි යෙදුනාහු ධර්මයේ හැසිරෙවු.

**7. සත්තොපකාර නිරතා කුසලෙ සහායා
හො දුල්ලභා භුවි නරා විගතප්පමාදා
ලඞ්කාධිපං ගුණධනං කුසලෙ සහායං
ආගම්ම සඤ්චරථ ධම්මමලං පමාදං**

පින්වත්නි, පෘතුවියේ සත්වයන්ට උපකාර කිරීමෙහි ඇලුණා වූ, කුසල් කිරීමෙහි යහළු වූ, ප්‍රමාද නැත්තා වූ මනුෂ්‍යයෝ දුර්ලභ ය. ගුණය ම ධනකොට ඇති කුසලයට යහළු වූ ලංකේශ්වර රජු වෙත එළඹ ප්‍රමාද නැතිව කුසල ධර්මයේ යෙදෙවු.

**8. ධම්මො තිලොක සරණො පරමො රසානං
ධම්මො මහග්ඝරතනො රතනෙසු ලොකෙ
ධම්මො භවෙ තිභවදුක්ඛ විනාසහෙතු
ධම්මං සමාචරථ ජාගරියානුයුත්තා**

ධර්මය තුන්ලෝ වැසියන්ගේ පරම පිහිට කොට ඇත්තේ ය. රසයන් අතරින් උතුම් ම රසය වේ. මුතු

මැණික් ආදී වටිනා රත්නයන් ගෙන් උතුම්ම රත්නය යි. ඒකාන්තයෙන් තිසරණය තුන් භවයෙහිම භය දුක නැතිකිරීමට එකම හේතුව වේ. එබැවින් නිදිවර්ජිත කොට ධර්මයේ හැසිරෙවු.

**9. නිද්දං විනොදයථ භාවයථප්පමෙය්‍යං**
**දුක්ඛං අනිච්චමපි චෙහ අනත්තතඤ්ච**
**දෙහෙ රතිං ජහථ ජජ්ජරභාජනාභෙ**
**ධම්මං සමාචරථ ජාගරියානුයුත්තා**

නිදි දුරුකරවු, අප්‍රමාණව මෙම ශරීරයෙහි අනිත්‍ය දුක්ඛ අනාත්ම ත්‍රිලක්ෂණය වඩවු, ඇදුරු වූ (දිරූ) බඳුනක් බඳු වූ මේ සිරුරෙහි ඇල්ම නැති කරවු. නිදි වර්ජිත වූවාහු ධර්මයේ හැසිරෙවු.

**10. ඔකාසමජ්ජ මම නත්ථි සුවෙ කරිස්සං**
**ධම්මං ඉතීහලසතා කුසලප්පයොගෙ**
**නාලං තියද්ධසු තථා භුවනත්තයෙ ච**
**කාමං න චත්ථි මනුජො මරණා පමුත්තො**

මට අද කුසල් කිරීමට ඉඩ නැත. දානාදී කුසල ධර්මය හෙට කරමියි කියා මෙසේ කුසල් කිරීමෙහි මැලිබව සුදුසු නම් නොවෙයි. තුන් කාලයේ හා තුන් ලෝකයේහිද මරණයෙන් මිදුණු සත්වයෙක් නම් ඒකාන්තයෙන් නැත්තේ ම ය.

**11. ඛිත්තො යථා නභසි කෙනචිදෙව ලෙඩ්ඩු**
**භූමිං සමාපත්ති භාරතයා ඛණෙන**
**ජාතත්තමෙව බලු කාරණමෙකමත්‍ර**
**ලොකං සදා නනු ධුවං මරණාය ගන්තුං**

යම්සේ කිසිවෙකු විසින් අහස් කුස දමන ලද ගල් කැටයක් බර බව නිසා සැනෙකින් බිමට වැටේ ද, එසේ

ම ලෝක සත්වයාගේ උපන් බව ම මරණයට ඒකාන්තයෙන් නිත්‍ය වූ අසහාය වූ කරුණක් නොවන්නේද? වන්නේ ම ය.

**12. කාමං නරස්ස පතතො ගිරිමුද්ධනාතො**
**මජ්ඣෙ න කිඤ්චි භයනිස්සරණාය හෙතු**
**කාමං වජන්ති මරණං තිභවෙසු සත්තා**
**භොගෙ රතිං පජහථාපි ච ජීවිතෙ ච**

පර්වත මුදුණනකින් වැටෙන්නා වූ මිනිසාට මධ්‍යයෙහි හෙවත් පොළොවටත් පර්වතයටත් අතරෙහි භයින් මිදීමට කිසි පිළිසරණක් ඒකාන්තයෙන් නැත්තේ ද, එපරිද්දෙන් ම තුන්ලෝ සත්වයන් ඒකාන්තයෙන් ම මරණයට පැමිණෙත්. එම නිසා භෝගයෙහි ද හා ජීවිතයෙහි ද ඇති ඇලීම (ආශාව) දුරු කරවු.

**13. කාමං පතන්ති මහියා බලු වස්සධාරා**
**විජ්ජුල්ලතා විතතමෙඝ මුඛා පමුත්තා**
**එවං නරා මරණභීම පපාතමජ්ඣෙ**
**කාමං පතන්ති නහි කොචි භවෙසු නිච්චො**

විදුලියෙන් ගැවසීගත් වළාකුළින් මිදුනා වූ වැසි ධාරාවෝ ඒකාන්තයෙන් පොළොවෙහි වැටෙත් ද, එසේ මනුෂ්‍යයෝ ද මරණය නැමති බිහිසුණු ප්‍රපාතයට වැටෙත් ම ය. එබැවින් භවයන්හි නිත්‍ය වු කිසිවක් නම් නැත.

**14. වෙලාතටෙ පටුතරොරු තරංගමාලා**
**නාසං වජන්ති සතතං සලිලාලයස්ස**
**නාසං තථා සමුපයන්ති නරාමරානං**
**පාණානි දාරුණතරෙ මරණොදධිම්හි**

මුහුදේ තදින් තර වූ මහත් රළ පන්ති වෙරළ කොනේ වැදී නිතර විනාශ භාවයට යෙත් ද, එපරිද්දෙන්ම මිනිසුන් හා දෙවියන්ගේ ජීවිතය ද අතිශයින් දරුණු වූ මේ මරණය නැමති සාගරයෙහි විනාශයට යත්.

**15. රුද්ධොපි සො රථවරස්ස ගජාධිපෙහි**
**යොධෙහි චාපි සබලෙහි ච සායුධෙහි**
**ලොකං විචක්ඛ්විය සදා මරණුසභො සො**
**කාමං නිහන්ති භුවනත්තය සාලි දණ්ඩං**

ඒ මරණ නැමති වෘෂභ තෙමේ උතුම් රිය අස් ඇත් රාජයන් හා බල සහිත වූ හෙවත් ශක්ති ඇති ආයුධ වන් යෝධයන් විසින් ද වළක්වණු ලද්දේ වුවත් සත්ව ලෝකයා විශේෂයෙන් රවටා තුන් ලෝ වැසි ජනයා නැමති හැල් කෙත බඩය ඒකාන්තයෙන් ම  කා දමා විනාශ කෙරෙත් ම ය.

**16. භො මාරුතෙන මහතා විහතො පදීපො**
**ඛිප්පං විනාස මුඛමෙති මහප්පභොපි**
**ලොකෙ තථා මරණචණ්ඩ සමීරණෙන**
**ඛිප්පං විනස්සති නරායුමහා පදීපො**

පින්වත්නි, මහත් වූ  සුළඟින් පහරණ ලද මහත් ආලෝකය ඇත්තා වූ මහා ප්‍රදීපය යම්සේ වහා විනාශයට පැමිණේ ද,  එපරිද්දෙන් ම ලොවෙහි මරු සැඩ පවන හේතු කොට ගෙන මිනිසුන් ගේ ආයුෂය නැමති මහා පහන වහා විනාශයට යන්නේ ය.

**17. රාමජ්ජුනප්පභූති භූපති පුඞ්ගවා ච**
**සූරා පුරෙ රණමුඛෙ විජිතාරි සඞ්ඝා**
**තෙපීහ චණ්ඩ මරණොඝ නිමුග්ගදෙහා**
**නාසං ගතා ජගති කෙ මරණා පමුත්තා**

පෙර යුධ පෙරමුණෙහි දිනන ලද සතුරු සමූහයා ඇති සූර වූ රාම අර්ජුනාදී ශ්‍රේෂ්ඨ රජවරු වූවාහු ද, ඔවුහු මේ ලෝකයේ සැඩ මරණ නැමති ජල ප්‍රවාහයේ ගිලුණු සිරුරු ඇත්තහු විනාශයට පැමිණියාහු ය. ලෝකයේ මරණයෙන් මිදුණු කවුරුනම් වෙත්ද?

**18. ලක්ඛී ච සාගරපටා සධරාධරා ච**
**සම්පත්තියො ච විවිධා අපි රූපසොභා**
**සබ්බා ච තා අපි ච මිත්තසුතා ච දාරා**
**කෙ වාපි කං අනුගතා මරණං වජන්තං**

ඓශ්වර්ය ද, සාගරය ම වස්ත්‍ර කොට ඇති පර්වත සහිත වූ පෘතුවි තොමෝ ද, අනේක ප්‍රකාර වු සම්පත්තිහු ද යන ඒ සියලු (අවිඤ්ඤාණක) වස්තූහු ද, රූප සෞන්දර්යෙන් යුක්ත මිත්‍රයන් හා පුත්‍රයෝ ද, භාර්යාවෝ ද, යන (විඤ්ඤාණක) වස්තූහු ද යන කවුරු හෝ, මරණයට පැමිණෙන්නා වූ කිනම් පුද්ගලයෙකු අනුව ගමන්කළෝ ද?

**19. බ්‍රහ්මා සුරා'සුරගණා ච මහානුභාවා**
**ගන්ධබ්බ-කින්නර-මහොරග-රක්ඛසා ච**
**තෙ වා'පරෙ ච මරණග්ගිසිඛාය සබ්බෙ**
**අන්තෙ පතන්ති සලභා ඉව ඛීණපුඤ්ඤා**

මහානුභාව සම්පන්න බ්‍රහ්ම දිව්‍ය අසුර ගාන්ධර්ව කිණ්ණරාග මහාඋරග හා රාක්ෂස යන මොහු ද, මෙයින් අන්‍ය වූ සෙසු සියලු සත්වයෝ ද, පින් ක්ෂය වීමෙන් කෙළවර මරණ නැමති ගිණි සිළුවෙහි පළඟැටියන් මෙන් වැටෙත්.

**20\. යෙ සාරිපුත්තපමුඛා මුනිසාවකා ච**
**සුද්ධා සදාසවනුදා පරමිද්ධිපත්තා**
**තෙ චාපි මච්චුවළභා මුඛ සන්නිමුග්ගා**
**දීපා ඉවා'නිල-හතා ඛයතං උපෙතා**

හැම කල්හි පිරිසිදු වූ එහෙයින් කාමාදී චතුර්විධ ක්ලේෂයන් දුරු කළා වූ ඍධියේ කෙළවරට පැමිණියා වූ සාරිපුත්ත ආදී යම් බුද්ධ ශ්‍රාවක කෙනෙක් වෙත් ද, ඔවුහු ද මරණ නැමති වඩබාග්නිය ඉදිරියෙහි වැටුනාහු වාත වේගයෙන් පහරන ලද, ප්‍රදීපය මෙන් විනාශයට පැමිණියාහු ය.

**21\. බුද්ධාපි බුද්ධකමලා'මල-චාරුනෙත්තා**
**බත්තිංසලක්ඛණ විරාජිත රූපසොභා**
**සබ්බාසවක්ඛයකරාපි ච ලොකනාථා**
**සම්මද්දිතා මරණමත්ත-මහාගජෙන**

පුබුදු පියුමක් මෙන් නිර්මල වූ මනහර නෙත් ඇති දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හෙබි රූප සෝභාව ද ඇති සියළු කෙලෙස් දුරුකළ, ලෝකයාට එකම පිහිට වූ බුදු රජාණන් වහන්සේ ද මරණය නැමති මත් ඇතා විසින් පාගා සුණු විසුණු කරන ලදි.

**22\. රොගාතුරෙසු කරුණා න ජරාතුරෙසු**
**ඛිඩ්ඩාපරෙසු සුකුමාරකුමාරකෙසු**
**ලොකං සදා හනති මච්චු මහාගජින්දො**
**දාවා'නලො වනමිවා'විරතං අසෙසං**

රෝගයෙන් පීඩිත වූවන් හා ජරාවෙන් පීඩිත වූවන් කෙරෙහි ද, ක්‍රීඩා ලෝල වූ සියුමැළි කුමාර වරුන් කෙරෙහි ද, මරහුගේ කරුණාවක් නොමැත්තේ ය. ලැව් ගින්නක් මුලු වනාන්තරය ම ඉතිරි නොකොට දවා තෘප්තිමත් නොවන්නේ යම් සේ ද, එමෙන් ම මේ මරණ

නැමති මහා හස්ථි රාජයා හැම කල්හි ලෝක සත්වයා විනාශ කෙරේ.

**23. ආපුණ්ණතා න සලිලෙන ජලාසයස්ස
කට්ඨස්ස වාපි බහුතා න හුතාසනස්ස
භුත්වාන සො තිභුවනම්පි තථා අසෙසං
භො නිද්දයො න බලු පීතිමුපෙති මච්චු**

පින්වත්නි, මහා සාගරය ජලය කරනකොට ගෙන හාත්පසින් පිරීමක් ඇති නොවේ ද, ගින්නට කොපමණ දර ඇමුවත් බොහෝ බවක් නොවේ ද, එපරිද්දෙන් ම කරුණා රහිත වූ ඒ මාර තෙමේ මුලු තුන් ලෝවැසි ජනයා අනුභව කොටත් ඒකාන්තයෙන් සතුටට පත් නොවේ.

**24. භො මොහ මොහිතතයා විවසො අධඤ්ඤො
ලොකො පතන්ත්‍යපිහි මච්චුමුඛෙ සුභීමෙ
භොගෙ රතිං සමුපයාති නිහීනපඤ්ඤො
දොලා තරඞ්ගචපලෙ සුපිනොපමෙය්‍ය**

පින්වත්නි, වසඟ රහිත වූ පිං නැත්තා වූ ද, විශෙෂයෙන් හීන පඤ්ඤා ඇති නොහොත් බෙහෙවින් ලාමක වූ ලෝවැසි ජනයා අතිශයින් බිහිසුණු වූ මරුමුවට පත්වෙයි. එහෙත් මෝහයෙන් මුලාවීම හේතුවෙන් ඔංචිල්ලා හා රළ පහර මෙන් චංචල වූ ද, සිහිනයකට බඳු උපමා ඇත්තා වූ ද, පංච කාම සම්පත්ති අභිරතයට ඉතා ආශාවෙන් එළඹෙත්.

**25. එකොපි මච්චුරභිහන්තුමලං තිලොකං
කිං නිද්දයා අපි ජරාමරණානුයායී
කො වා කරෙය්‍ය විහසුවෙසු ච ජීවිතාසං
ජාතො නරො සුපින සඞ්ගම සන්නිභෙසු**

හුදකලා වූම මරණය තුන්ලොව වනසන්නට සමර්ථ වෙයි. නිදා ගැනීමෙහි කවර නම් ප්‍රයෝජනයක් වෙයි ද? ජරාව හා මරණය අනුව යන සුලු වූ උපන් කවර නම් මිනිසෙක් තෙමේ සිහිනෙන් වන එකතුවීමක් බඳු සැපතෙහි හා ජීවිතයෙහි ආශාකරන්නේ ද?

**26. නිච්චාතුරං ජගදිදං සභයං සසොකං**
**දිස්වා ච කොධ-මද-මොහ-ජරාභිභූතං**
**උබ්බෙගමත්තමපි යස්ස න විජ්ජතී වෙ**
**සො දාරුණො න මරණං වත තං ධිරත්ථු**

නිරන්තරයෙන් රෝගයන්ගෙන් පෙලුණා වූ භය සහිත වූ ශෝකයෙන් යුක්ත වූ නව ආඝාත වස්තුක ක්‍රෝධය ද, රාගාදී මද ද, මොහය ද, ජරාව (වයසට යාම) යන මෙයින් මඩනා ලද මේ ලොව දැකත් සසර කළ කිරීම් මාත්‍රයක් වත් නූපදී ද, එබඳු සත්ව තෙමේ දරුණු පුද්ගලයෙකු වන්නේ ය. මරණය ඔහු තරම් දරුණු නොවේ. ඒ බිහිසුණු පුද්ගලයාට නින්දා වේවා.

**27. හො හො න පස්සථ ජරා'සිධරඤ්හි මච්චු**
**මාහඤ්ඤදමානමඛිලං සතතං තිලොකං**
**කිං නිද්දයා නයථ වීතභයා තියාමං**
**ධම්මං සදා'සවනුදං චරථ'ප්පමත්තා**

පින්වත්නි, පින්වත්නි, යම්හෙයකින් ජරාව නැමති කඩුව දරන්නා වූ සියලු තුන්ලෝ වැසි ජනයා නිතර හාත්පසින් නසන්නා වූ මරුවා තෙපි නොදක්නෙහි ද? එහෙයින් පහ වූ භය ඇතිව හෙවත් භියෙන් තොරව නිදා ගැනීමෙන් තුන්යම රාත්‍රිය කෙසේ නම් ගත කරන්නාහු ද? එබැවින් තෙපි කෙළෙසුන් දුරුකරන දසකුසල ධර්මයේ හැමදා පමානොවී හැසිරෙවු.

**28. භාවෙථ භො මරණමාර-විවජ්ජනාය**
**ලොකෙ සදා මරණ සඤ්ඤමිමං යතත්තා**
**එවඤ්හි භාවනරතස්ස නරස්ස තස්ස**
**තණ්හා පහීයති සරීරගතා අසෙසා**

පින්වත්නි, මාරයාගේ නැති කිරීම පිණිස සැමදා මේ මරණ සඤ්ඤාව වීර්යෙන් යුක්තව වඩවු. මෙසේ භාවනා කිරීමේ ඇලුනා වූ ඒ මිනිසා ගේ ශරීරයට විෂයව පවත්නා වූ සියලු තණ්හා පහව යන්නේ ය.

**29. රූපං ජරා පියතරං මලිනීකරොති**
**සබ්බං බලං හරති අත්තනි ඝොරරොගො**
**නානූපභොග පරිරක්ඛිත මත්තභාවං**
**භො මච්චු සංහරති කිං ඵලමත්තභාවෙ?**

ජරා තුමෝ අතිශයින් ප්‍රිය වු රූපය කිලිටි කෙරේ, භයානක කාශා ස්වාසාදී රෝගී තෙමේ තමා කෙරෙහි වු සියලුම බලය හෙවත් ශක්තිය පැහැරගනී. පින්වත්නි, මරණ තෙමේ නොයෙක් උපභෝග පරිභෝග වස්තුවෙන් රකින ලද මේ ජීවිතය නැත්නම් ආයුෂ විනාශ කරයි. එබැවින් ජීවිතයේ කිනම් ප්‍රයෝජනයක් ද?

**30. කම්මා'නිලා'පහතරොග-තරංගභඞ්ගෙ**
**සංසාර සාගර මුඛෙ විතතෙ විපන්නා**
**මා මාපමාදමකරිත්ථ කරොථ මොක්ඛං**
**දුක්ඛොදයො නනු පමාදමයං නරානං**

කර්ම නැමති සුලඟින් නසන ලද රෝග නැමති රළ බිඳුම් ඇති මහත් වූ සංසාර සාගර මුඛයෙහි ගිලුනා වූ නොහොත් විපතට වැටුනා වූ තෙපි අප්‍රමාදවවු. සසරින් මිදෙවු හෙවත් නිවන් අත්පත් කරවු. ප්‍රමාදය නිසා ම සත්වයන් තුළ දුක් ඇති වීම සිදු වෙනවා නොවේ ද?

**31. භොගා ච මිත්ත-සුත-පොරිස බන්ධවා ච
නාරී ච ජීවිතසමා අපි ඛෙත්තවත්ථු
සබ්බානි තානි පරලොකමිතො වජන්තං
නා'නුබ්බජන්ති කුසලා'කුසලං'ව ලොකෙ**

සියලු සම්පත්තීහු ද, මිත්‍ර පුත්‍ර පරිවාර ජනයා හා බන්ධූහු ද, පණ වැනි භාර්යාවෝ ද, කෙත්වතු ද යන මේ සියල්ලෝම මෙළොවින් පරළොවට යන්නාහු අනුව නොයන්නාහ. කුසල අකුසල කර්මයෝ මෙළොවින් පරළොවට යන්නාහු ඔහු පසුපසම යති.

**32. භො විජ්ජු-චඤ්චලතරෙ භවසාගරම්හි
ඛිත්තා පුරාකත-මහාපවනෙන තෙන
කාමං විභිජ්ජති ඛණෙන සරීරනාවා
හත්ථෙ කරොථ පරමං ගුණහත්ථසාරං**

පින්වත්නි, විදුලියක් මෙන් අතිශයින් චංචල ස්වභාවයක් ඇති භව නැමති සාගරයේ ඒ පෙර කරන ලද කුසලාකුසල කර්ම නැමති සැඩ සුළඟින් පහරන ලද ශරීර නැමති නෞකාව ඒකාන්තයෙන් සැනෙකින් බිඳේ. එබැවින් ගුණ නැමති හස්ථ සාරය ම අත්පත් කරවු.

**33. නිච්චං විභිජ්ජතිහ ආමක භාජනං'ව
සංරක්ඛිතොපි බහුධා ඉහ අත්තභාවො
ධම්මං සමාචරථ සග්ග-ගතිප්පතිට්ඨං
ධම්මො සුචිණ්ණම්හමෙව ඵලං දදාති**

මේ ලෝකයේ නොයෙක් ආකාරයෙන් මොනවට රක්නා ලද මේ ශරීරය තෙමේ අමු මැටි බඳුනක් මෙන් නිතර ම බිඳේ. එහෙයින් දෙව්ලොව ගමනට පිහිට වූ කුසල ධර්මයේ හැසිරෙවු. මේ ආත්ම භාවයේදී ම හොඳින් පුරුදු කරන ලද කුසල ධර්මය ම සැප විපාක ඵල ගෙනදෙයි.

## 34. රන්ත්වා සදා පියතරෙ දිවි දෙවරජ්ජෙ
## තම්හා චවන්ති විබුධා අපි ඛීණපුඤ්ඤා
## සබ්බං සුඛං දිවි භුවීහ වියොගනිට්ඨං
## කො පඤ්ඤවා භවසුඛෙසු රතිං කරෙය්‍ය

දෙව්ලෝ සැම කල්හි අතිශයින් ප්‍රිය වූ දිව්‍ය රාජ්‍යහී ද දෙවඟනන් හා අභිරමනය කොට ක්ෂය වූ පින් ඇති ඒ දෙවියෝ ද දෙව් ලොවින් චුත වෙත්. දෙව්ලොව හා මෙලොව ඇති සැප සියල්ල ම වෙන්වීම කෙළවර කොට ඇත්තේ ය. එහෙයින් නුවණැති කවරෙක් නම් භව සැපතෙහි ඇලෙන්නේ ද?

## 35. බුද්ධො සසාවකගණො ජගදෙකනාථො
## තාරාවලීපරිවුතොපි ච පුණ්ණචන්දො
## ඉන්දොපි දෙවමකුටඞ්කිත පාදපඞ්ජෝ
## කො ඵෙණපිණ්ඩ-න-සමො තිභවෙසු ජාතො

ලෝකයාට අසහාය ස්වාමී වූ ශ්‍රාවක සමූහයා සහිත බුදුරජ ද, තරු පිරිවරන පුන්සඳ මඬල ද, දෙවියන්ගේ ඔටුණු වලින් සළකුණු කරන ලද පාපියුම් ඇති සක්දෙව් රජ ද, යන මේ ආදී  වූ තුන් ලොව උපන් කවරෙක් නම් පෙණ පිඬකට සමාන නොවන්නේ ද?

## 36. ලීලාවතංසමපි යොබ්බන රූපසොභං
## අත්තූපමං පියජනෙන ච සම්පයොගං
## දිස්වාපි විජ්ජුචපලං කුරුතෙ පමාදං
## හො මොහමොහිතජනො භවරාගරත්තො

පින්වත්නි, විවිධ ලීලා විලාස ගැනීමට පැළඳි මුදුන් මල්කඩක් බඳු වූ යොවුන් බවින් යුක්ත වූ රූප සෝභාව ඇත්තාහු ප්‍රිය ජනයන් හා එක්වීම ද, විදුලියක් මෙන් අස්ථිර යැයි දැක දැකත් භවයේ ඡන්ද රාගයෙන් ඇළුණු

මෝහයෙන් මුලා වූ ජන තෙමේ කුසල ධර්මයන් රැස් කිරීමෙහිලා ප්‍රමාද වේ.

**37. පුත්තො පිතා භවති මාතු පතීහ පුත්තො
නාරී කදාචි ජනනී ච පිතා ච පුත්තො
එවං සදා විපරිවත්තති ජීවලොකො
චිත්තෙ සදා'තිචපලෙ බලු ජාතිරඞ්ගෙ**

මේ ජීවිතයේ දී යම් දෙමව්පිය කෙනෙකුන්ට ලැබුණු පුත් තෙමේ කිසියම් කලෙක්හි ඔවුනට ම පියා වේ. පිය තෙමේ කිසි කලෙක්හි ඔවුනට ම පුතු වේ. ස්ත්‍රී තොමෝ යම් කලෙක මව් ද වන්නීය. පිය තෙමේ පුතෙක් හෝ වන්නේය. මෙසේ සත්ව ලෝකය හැම කල්හි අතිශයින් චපල වූ විචිත්‍ර වූ ජාති නැමති රඟහලේ විවිධාකාර පරිවර්තන වන්නේ ය.

**38. රන්ත්වා පුරෙ විවිධ-ඵුල්ල-ලතාකුලෙහි
දෙවාපි නන්දනවනෙ සුරසුන්දරීහි
තෙ වෙ'කදා විතත-කණ්ටක-සඞ්කටෙසු
භො කොටිසිම්බලිවනෙසු ඵුසන්ති දුක්ඛං**

පින්වත්නි, පෙර විවිධ වූ පිපි මල් ඇති ලතාවන් ගෙන් ගැවසීගත් නඳුන් වනයෙහි දෙවඟනන් හා අභිරමනය කළ ඒ දෙවියෝ ද ඒකාන්තයෙන් ම එක් කලෙක්හි දී පැතිරීගිය කටුවලින් ගැවසීගත් කොළහිඹුල් වන අපායන්හී වැටී දුක් අනුභව කරත්.

**39. භුත්වා සුධන්නමපි කඤ්චන-භාජනෙසු
සග්ගෙ පුරෙ සුරවරා පරමිද්ධිපත්තා
තෙ චාපි පජ්ජලිත-ලොහගුලං ගිලන්ති
කාමං කදාචි නරකාලය වාසභූතා**

දෙව්ලොව මහත් සෘද්ධියට පත් ඒ සුරේන්ද්‍රයෝ පවා රන් බඳුනෙහි ක්ෂුධා භෝජනය අනුභව කොටත් එයින් සැව (චුතව) පසු කලෙක්හි, නරකාදියෙහි උපන්නා වූ ගිණි ගෙන දිළිහෙන ලෝ ගුලි ගිලිත්.

## 40. භුත්වා නරිස්සරවරා ච මහිං අසෙසං
## දෙවාධිපා ච දිවි දිබ්බසුඛං සුරම්මං
## වාසං කදාචි බුරසඞ්චිත-භූතලෙසු
## තෙ වා මහාරථගණා'නුගතා දිවීහ

යම් කෙනෙක් මිනිස් ලොව හෝ දෙව්ලොව මහත් රථ සමූහයා පිරිවරා ඔබමොබ ඒ අනුව ගමන් කළෝ ද, ඒ සැම මුළු පොළොව ම අනුභව කොටත් නැත්නම් මේ පොළොවේ ඇති යම් තාක් සැප විඳත් දෙව්ලොව සුරම්‍ය දිව්‍ය සැප විඳත් ඇතැම් කලෙක අපායෙහි උඩුකුරු කරන ලද දැලිපිහියා ධාරාවන්ගෙන් ගැවසීගත් නිරයෙහි වැටෙත්.

## 41. දෙවඞ්ගනා ලලිතභින්න-තරඞ්ගමාලෙ
## රඞ්ගෙ මහිස්සර-ජටාමකුටා'නුයාතෙ
## රන්ත්වා පුරෙ සුරවරා පමදාසහායා
## තෙ චාපි ඝොරතර-වෙතරණිං පතන්ති

පෙර දෙවඟනන් හා පතුරුවන ලද යහළු සබඳකම් ඇති ඒ දෙවියෝ පවා දෙවඟනන්ගේ ලලිතාභි නයන සිත්කළු අත් පා විදීම් ආදියෙහි බිඳුනු රළමාලාවන් හා සමාන බැව් ඇති මෙහෙසුරුගේ ජටා බන්ධනය හා අනුව ගිය නර්තනයෙහි ඒ දිවසරන් හා අභිරමනය කොට පසු කලෙක්හි බිහිසුණු වේතරණී නම් ඔසුපත් නරකයෙහි වැටේ.

**42. ඵුල්ලානි පල්ලව-ලතා-ඵලසඞ්කුලානි**
**රම්මානි නන්දනවනානි මනොරමානි**
**දිබ්බච්ඡරා-ලලිතපුණ්ණ-දරීමුඛානි**
**කෙලාසමෙරු-සිඛරානි ච යන්ති නාසං**

මොනවට පිපුණාවූ ලපලුපත්‍ය, වැල්ය, ඵලය යන මෙයින් ගැවසීගත්, නෙත්සිත් පිනවන්නා වූ නඳුන් වනයෙහි දෙවඟනන් විසින් විලාස කරන ලද පිරුණු දෙව් විමන් ඇති කෛලාසකූඨ, මහමෙර යන පර්වතයෝ ද විනාශ භාවයට යති.

**43. දොලා'නිලා'නල-තරංගසමා හි භොගා**
**විජ්ජුප්පභා'තිචපලානි ච ජීවිතානි**
**මායාමරීචි-ජලසොමසමං සරීරං**
**කො ජීවිතෙ ච විභවෙ ච කරෙය්‍ය රාගං**

උපභොග පරිභොග වස්තූන් ද ජීවිතය ද ඔංචිල්ලාව, සුළඟ හා ගින්න මෙන් අස්ථිරය. විදුලි එළිය මෙන් ඉතා චපල ය. ශරීරය මායාවක් මිරිඟුවක් හා දියෙහි පෙනෙන සඳෙහි පිළිබිඹුවකට සමාන ය. එබැවින් නුවණැති කවරෙක් නම් මේ අස්ථිර ජීවිතයෙහි සහ සම්පත්තියෙහි ආශාවක් ඇතිකර ගනීද?

**44. කිං දුක්ඛමත්ථි න භවෙසු ච දාරුණෙසු**
**සත්තොපි තස්ස විවිධස්ස න භාජනො කො**
**ජාතො යථා මරණරොග-ජරාභිභූතො**
**කො සජ්ජනො භවරතිං පිහයෙය්‍ය'බාලො**

දරුණු වූ කාමාදි භවයන්හි කවර නම් දුකක් නැත්තේ ද, සෑම දුකක් ම ඇත්තේ ය. කවරනම් සත්වයෙක් ඒ නානාවිධ දුක්ඛයන්ට භාජනය නොවන්නේ ද, උපන්නා වූ පුද්ගලයෙක් ජරාවය, රෝගය, මරණය යන මේවායින් මඩනාලද්දෙ වේ ද, එහෙයින් කවරනම් නුවණැති

සත්පුරුෂයෙක් භව සැපතෙහි ඇලීමක් ඇතිකර ගැනීමට කැමති වන්නේ ද?

**45. කෙ චාපි පජ්ජලිත-ලොහගුලං ගිලන්ති**
**සක්කා කථඤ්චිදපි පාණිතලෙන භීමං**
**දුක්ඛොදයං අසුචිනිස්සවනං අනත්තං**
**කො කාමයෙථ බලු දෙහමිමං අබාලො**

කවුරුන් හෝ සිය අත්ලෙන් ගිණි ගෙන දිළිහෙන ලෝ ගුලි ගැනීමට කොයිලෙසකින් හො සමර්ථ වේ ද, එසේ ම යලි දුකට මුල් වූ නව දොරකින් අසුචි වැගිරෙන, තමාගේ වසඟයෙහි නොපවතින, මේ ශරීරයට කවර නම් නුවණැත්තෙක් කැමති වන්නේ ද?

**46. ලොකෙ න මච්චු-සමමත්ථි භයං නරානං**
**න ව්‍යාධිදුක්ඛ-සමමත්ථි ච කිඤ්චි දුක්ඛං**
**එවං විරූපකරණං න ජරාසමානං**
**මොහෙන භො රතිමුපෙති තථාපි දෙහෙ**

පින්වත්නි, සත්ව ලොකයේ වෙසෙන මිනිස් ආදී හැම සත්වයන්ට මරණය හා සමාන භයෙක් නැත්තේ ය. ව්‍යාධි දුක හා සමාන දුකක් ද නැත්තේ ය. වයසට යාමෙන් ඇතිවන දිරාපත්වීම හා සමාන මිනිසා විරූප කරන කරුණක් ද නැත. එසේ වුවද, මෝහය හේතු කරගෙන සැමදා සිරුරෙහි ඇලීමට පැමිණෙති.

**47. නිස්සාරතො නලනලී-කදලීසමානං**
**අත්තානමෙව පරිභඤ්ඤති අත්තහෙතු**
**සම්පොසිතොපි කුසභාය ඉවාකතඤ්ඤූ**
**කායො න යස්ස අනුගච්ඡති කාලකෙරා**

මේ ශරීරය නිසරු බවින් කුලල්බට, හුණ, කෙසෙල් යන මෙවා හා සමාන ය. ආත්මයක් ඇතැයි යන මිත්‍යා

කල්පනාවෙන් තමා තමාට ම බොහෝ දුක්දෙයි. මේ ශරීරය කොපමණ පෝෂණය කලත්, කළගුණ නොදන්නා වූ අසත්පුරුෂයෙකු මෙන් අපගේ මරණයෙන් පසුව අප පසු පස්සේ, අප සමඟ නො එන්නේ ය.

**48. තං ඵෙණපිණ්ඩ-සදිසං විසසූල-කප්පං**
**තොයා'නිලා'නලමහී-උරගාධිවාසං**
**ජිණ්ණාලයං'ව පරිදුබ්බලමත්තභාවං**
**දිස්වා නරො කථමුපෙති රතිං සපඤ්ඤො**

නුවණැති මිනිස් තෙමේ පෙණ පිඩක් මෙන් අස්ථිර වූ ද, විස පෙවූ උලක් හා සමාන වූ ද, පඨවි ධාතුව, ආපෝ ධාතුව, තේජෝ ධාතුව, වායෝ ධාතුව යන සතරමහා භූතයන් නැමති සර්පයන්ට වාසස්ථානයක් වූ දිරාපත් ගෙයක් වැනි සෑමවිට ම දුර්වල වූ ඒ ආත්ම භාවය දැකත් කම් සැපතෙහි කෙසේ නම් ඇලෙන්නේ ද?

**49. ආයුක්ඛයං සමුපයාති ඛණෙ ඛණෙපි**
**අන්වෙති මච්චු හනනාය ජරාසිපාණී**
**කාලං තථා න පරිවත්තති තං අතීතං**
**දුක්ඛං ඉදං නනු භවෙසු විචින්තනීයං**

සත්වයාගේ ආයුෂ කෙමෙන් කෙමෙන් ගෙවේ. ජරාව නැමති කඩුව අතැති මාරයා ආයුෂ නැසීම පිණිස අප පසු පස්සේ එයි. එහෙත් ගෙවූ කාලය නම් ආපසු නොපැමිණේ. කාමාදි භවයන්හි ඇති දුක විශේෂයෙන් ඔබ සිතිය යුතු නොවේද?

**50. අප්පායුකස්ස මරණං සුලභං භවෙසු**
**දීඝායුකස්ස ච ජරා ව්‍යසනඤ්ච නෙකං**
**එවං භවෙ උභයතොපි ච දුක්ඛමෙව**
**ධම්මං සමාචරථ දුක්ඛ-විනාසනාය**

භවයන් හි අල්ප ආයුෂ ඇත්තාහුට මරණය සුලභ වේ. දීර්ඝ ආයුෂ ඇත්තාහුට නොයෙක් ජරා ව්‍යසන ඇති වේ. හෙවත් ජරාව සුලභ වේ. මෙසේ මේ දෙ ආකාරයෙන් ම භවයෙහි දුකම ඇත. එබැවින් මේ දුක් නැති කිරීම පිණිස කුසල ධර්මයේ හැසිරෙවු.

**51. දුක්ඛග්ගිනා සුමහතා පරිපීළිතෙසු**
**ලොකත්තයස්ස වසතො භවචාරකෙසු**
**සබ්බත්තනා සුචරිතස්ස පමාදකාලො**
**හො හො න හොති පරමං කුසලං චිණාථ**

පින්වත්නි, පින්වත්නි, ඉතා මහත් වූ දුක් ගින්නෙන් හාත්පසින් පෙළෙන භව බන්ධනාගාරයන් හි වෙසෙන, තුන් ලෝ වසන ජනයා හට කුසල් දහම් පිරීමට ප්‍රමාද කාලයක් නොවේ ම ය. නොපමාව ම කුසල් දහම් පිරිය යුතු ය. එබැවින් හැම ආකාරයකින් ම උතුම් කුසල ධර්මයන් රැස් කරවු.

**52. අප්පං සුඛං ජලලවං විය හො තිණග්ගෙ**
**දුක්ඛන්තු සාගරජලං විය සබ්බලොකෙ**
**සංකප්පනා තදපි හොති සභාවතො හි**
**සබ්බං තිලොකමපි කෙවලදුක්ඛමෙව**

පින්වත්නි, සියලු ලෝකයෙහි සැපය තණපත් අග පිණි බිඳක් මෙන් ඉතා ස්වල්පය. දුක සයුරේ ජලය මෙන් ඉතා මහත් ය. සැපය හැඟීමක් මිස එබන්ඳක් කොහෙත්ම නැත. එබැවින් ස්වභාවයෙන් ම මේ මුළු තුන් ලෝකය තනිකර ම දුක් ගොඩකි.

**53. කායො න යස්ස අනුගච්ඡති කායහෙතු**
**බාලො අනෙකවිධමාචරතීහ දුක්ඛං**
**කායො සදා කලිමලා-කලිලඤ්ඣි ලොකෙ**
**කායෙ රතො'නවරතං ව්‍යසනං පරෙති**

මේ ශරීරය එහි පැවත්ම පිණිස කිසිවෙකු අනුව නොයයි. එහෙත් අනුවණ පුද්ගලයන් ශරීරය හේතුවෙන් සතුන් මැරීම ආදී, දුකට හේතුවෙන බොහෝ අකුසල් සිදු කරයි. මේ ශරීරය හැමවිට පාපයෙන් හා අපිරිසිදු දෙයින් හාත්පසින් පිරී ඇත. මෙබඳු සිරුරෙහි ඇළුණු පුද්ගල තෙමේ ඒකාන්තයෙන් විපතට පැමිණේ.

## 54. මීළ්හාකරං කලිමලා‘කරමාමගන්ධං
## සූළා‘සි-සල්ල-විසපන්නග-රොගභූතං
## දෙහං විපස්සථ ජරාමරණාධිවාසං
## තුච්ඡං සදා විගතසාරමිමං විනින්ද්‍යං

දුගඳ වූ අශුචි ආකරයක් වැනි වූ පාප-මලයට උප්පත්ති ස්ථානයක් වූ හුල්, කඩු, ඊතල, විෂඝෝර සර්ප, රෝග ආදියට සමාන වූ ජරා මරණයන්ට නිවසක් වැනි වූ හිස් වූ අසාර වූ නින්දා කටයුතු වූ මේ සිරුර අනිත්‍ය දුක්ඛ අනාත්ම අශුභ ලෙස දකිමින් විපස්සනා වඩවු.

## 55. දුක්ඛං අනිච්චමසුභං වත අත්තභාවං
## මා සංකිලෙසය න විජ්ජති ජාතු නිච්චො
## අම්භො න විජ්ජති හි අප්පමපීහ සාරං
## සාරං සමාචරථ ධම්මමලං පමාදං

පින්වත්නි, දුක් සහිත වූ, නිත්‍ය නොවූ, සුභ නොවූ මේ ආත්ම භාවය ඒකාන්තයෙන් කාම විතර්ක ආදියෙන් කිලිටි කර නොගනු. මෙලොව කිසි කලෙක්හිදු නිත්‍ය සත්වයෙක් නැත. මේ ආත්ම භාවයෙහි ස්වල්ප වූ ද සාරයක් නැත්තේ ය. එහෙයින් අප්‍රමාදීව සාර වූ ධර්මයෙහි මනාකොට හැසිරෙවු.

**56. මායාමරීචි-කදලී'නල-ඵෙණපුඤ්ජ-
ගංගාතරඞ්ග-ජලබුබ්බුල-සන්නිභෙසු
ඛන්ධෙසු පඤ්චසු ඡළායතනෙසු තෙසු
අත්තා න විජ්ජති හි කො න වදෙය්‍ය'බාලො**

මායාව, මිරිඟුව, කෙසෙල් ගස, ගින්න, පෙණපිඬ, ගංදියෙහි රළය, දිය බුබුලය, යන මොවුන්ට සමාන වූ රූපාදී පංචස්කන්ධයෙහි ද, චක්ෂුරාදි ෂඩායතනයන්හි ද, ආත්මයක් නැත්තේ ම ය. මෙය කවර නම් ප්‍රඥා වන්තයෙක් නොකියන්නේ ද?

**57. වඤ්ඣාසුතො සසවිසාණමයෙ රථෙ තු
ධාවෙය්‍ය චෙ චිරතරං සධුරං ගහෙත්වා
දීපච්චිමාලමිව තං ඛණභඞ්ගභූතං
අත්තාති දුබ්බලතරන්තු වදෙය්‍ය දෙහං**

වඳ ස්ත්‍රියකගේ පුතෙකු සාවෙකුගේ අඟකින් කරන ලද, රථයක වියදඬුව සහිතව හෙවත් රිය හිස අල්වාගෙන බොහෝ කාලයක් දුවන්නේ නම් (යන කරුණ සත්‍ය නම්), පහන්සිළු මාලාවක් මෙන් සැනෙකින් බිඳෙන සුළු වූ අතිශයින් දුබල වූ මේ ශරීරයට ද ආත්ම යැයි කිවහැකි ය.

**58. බාලො යථා සලිල-බුබ්බුල-භාජනෙන
ආකණ්ඨතො වත පිවෙය්‍ය මරීචිතොයං
අත්තාති සාරරහිතං කදලීසමානං
මොහා භණෙය්‍ය බලු දෙහමිමං අනත්තං**

දිය බිඳු ඇති බඳුනකින් උගුරට එන තුරු මිරිඟු ජලය බොන්නේ යැයි කියන්නේ (එය අසත්‍යක් වන්නේ) යම් සේ ද එසේ ම අනුවණයා මුලාවෙන් සාර රහිත වූ කෙසෙල් ගසක් සමාන වූ අනාත්ම වූ මෙම ශරීරයට ආත්ම යයි කියන්නේ ය.

**59. යෝ'දුම්බරස්ස කුසුමෙන මරීචිතොයං
වාසං යදිච්ඡති ස බෙදමුපෙති බාලො
අත්තානමෙව පරිහඤ්ඤති අත්තහෙතු
අත්තා න විජ්ජති කදාචිදපීහ දෙහෙ**

යමෙක් දිඹුල් මලින් සුවඳවත් වූ මිරිඟු දිය කැමති වේ ද (එවැන්නක් නොමැති හෙයින්) එයින් ඔහු වෙහෙසට පත් වේ. එසේ ම අනුවණයා ආත්මය හේතුවෙන් තමා ම වැනසේ. මේ ශරීරයෙහි ආත්ම ස්වභාවයක් කිසිකලෙක විද්‍යමාන නොවේ.

**60. පොසො යථා හි කදලීසු විනිබ්භුජන්තො
සාරං තදප්පමපි නොපලභෙය්‍ය කාමං
ඛන්ධෙසු පඤ්චසු ඡළායතනෙසු තෙසු
සුඤ්ඤෙසු කිඤ්චිදපි නොපලභෙය්‍ය සාරං**

යම් සේ පුරුෂයෙක් කෙසෙල් කඳන් පතුරු ගසන්නේ එයින් ස්වල්ප වූ ද සාරයක් ඒකාන්තයෙන් නොලබන්නේ ද, එසේ ම ආත්මයෙන් හිස් වූ රූපාදී පඤ්චස්කන්ධයෙහි ද, චක්ෂුරාදී ෂඩායතනයන්හි ද, නිත්‍ය සුභ සුඛ ආත්ම ලක්ෂණ වූ කිසිදු සාරයක් නොලබන්නේ ය.

**61. සුත්තං විනා න පටභාවමිහත්ථි කිඤ්චි
දෙහං විනා න බලු කොචි ඉහත්ථි සත්තො
දෙහො සභාවරහිතො ඛණභඞ්ගයුත්තො
කො අත්තහෙතු අපරො භුවි විජ්ජතීහ**

යම්සේ වස්ත්‍රයක නූල් හැර වස්ත්‍ර භාවයක් නැත්තේ ද, එසේ ම මේ ශරීරයෙහි පඤ්චස්කන්ධය හැර කිසි සත්වයෙක් නැත්තේ ය. මේ සිරුර ආත්මවාදී ස්වභාව රහිත ය. ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳෙන සුළුය.

එබැවින් මේ මිහිපිට අන් කවරෙක් ආත්ම යැයි කීමට හේතුවක් දිස්වේ ද?

**62. දිස්වා මරීචිසලිලඤ්හි සුදූරතො හො**
**බාලො මිගො සමුපධාවති තොයසඤ්ඤී**
**එවං සභාවරහිතෙ විපරීතසිද්ධෙ**
**දෙහෙ පරෙති පරිකප්පනයා හි රාගං**

පින්වතුනි, යම්හෙයකින් අඥාන මුවා ඉතාදුර සිට මිරිගුව දැක ජලය යැයි සංඥාවෙන් මුලා වී වහා ලඟට දුවයි ද, එසේ ම අඥාන පුද්ගල තෙමේ ද, නිත්‍යාදී ස්වභාව නැති මේ ශරීරය කෙරෙහි වැරදි ලෙස සිතීමෙන් ඇලීමට පැමිණේ.

**63. දෙහෙ සභාවරහිතෙ පරිකප්පසිද්ධෙ**
**අත්තා න විජ්ජති හි විජ්ජුම්වන්තලික්ඛෙ**
**භාවෙථ භාවනරතා විගතප්පමාදා**
**සබ්බාසවප්පහනනාය අනත්තසඤ්ඤං**

ආත්ම ස්වභාවයක් නැති වැරදි ලෙස සිතීමෙන් හටගත් මේ ශරීරයෙහි, අහසෙහි විදුලිය මෙන් ආත්මයක් විද්‍යමාන නොවේ. එබැවින් භාවනාවෙහි ඇලුනා වූ තෙපි ප්‍රමාද රහිත වූවාහු සියලු කෙලෙසුන් නැසීම පිණිස අනාත්ම සංඥාව වඩවු.

**64. ලාලාකරීස-රුධිරස්සු-වසා'නුලිත්තං**
**දෙහං ඉමං කලිමලා'කලිලං අසාරං**
**සත්තා සදා පරිහරන්ති ජිගුච්ඡනීයං**
**නානාසුචීහි පරිපුණ්ණඝටං යථෙව**

මෙලොව සත්වයෝ කෙල, අසූචි, ලේ, කඳුළු, වුරුණුතෙල් යන මේවා එක් කොට, නිමකරන ලද අපවිත්‍ර භාවයෙන් හා කිලිටු ස්වභාවයෙන් යුත් නිස්සාර

වූ අසූචි පිරවූ කළයක් බඳු මේ ශරීරය හැමකල්හි නොයෙක් සැප දී පරිහරණය කරති.

**65. නහාත්වා ජලඤ්හි සකලං චතුසාගරස්ස**
**මෙරුප්පමාණමපි ගන්ධමනුත්තරඤ්ච**
**පප්පොති නෙව මනුජො හි සුචිං කදාචි**
**කිං හො විපස්සථ ගුණං කිමු අත්තභාවෙ**

පින්වත්නි, මහමෙර පමණ සුවඳ කැටියක් ගෙන ඇඟ ගා සාගර සතරේ ම ජලය නැවත් මිනිසා කිසිකලෙකත් පිරිසුදු නොවේ. එසේ නම් මේ ශරීරයෙහි කිනම් ගුණයන් ඇත්දැයි තෙපි බලන්නාහු ද?

**66. දෙහො ස එව විවිධා'සුචිසන්නිධානො**
**දෙහො ස එව වධබන්ධන-රොගභූතො**
**දෙහො ස එව නවධා පරිභින්නගණ්ඩො**
**දෙහං විනා භයකරං න සුසානමත්ථි**

ඒ මේ සිරුර ම අසූචි උපදවන තැනකි. වධ බන්ධන රෝගයන්ගෙන් සැදුනකි. නව පොලකින් පැසවා ගිය ගෙඩියක් වැන්න. මේ සිරුර වැනි බිහිසුණු සොහොනක් තවත් නැත.

**67. අන්තොගතං යදිච මුත්තකරීසභාගො**
**දෙහා බහිං අතිචරෙය්‍ය විනික්ඛමිත්වා**
**මාතා පිතා විකරුණා ච විනට්ඨපෙමා**
**කාමං භවෙය්‍යු කිමු බන්ධුසුතා ච දාරා**

මේ සිරුර තුළ පවත්නා වූ මළ මුත්‍ර කොටස් ආදිය එළියට අවුත් ඒ ඒ තැන පැතිරී පවතී නම් මව්පියෝ පවා කරුණා ප්‍රේම රහිත වූවාහු පිළිකුල් කෙරෙති. අඹුදරුවන් හා ඥාතීන්ට ඇතිවන පිළිකුල කියනු කවරේද?

## 68. දෙහං යථා නවමුඛං කිමිසඞ්ඝගෙහං මංසට්ඨි-සෙදරුධිරා'කලිලං විගන්ධං පොසෙන්ති යෙ විවිධපාපමිහා'චරිත්වා තෙ මොහිතා මරණධම්මමහො වතෙවං

දොරටු නවයක් ඇති පණුවන්ට නිවාසයක් වූ ඇට, මස්, ලේ, දහඩිය වලින් ගැවසුනු දුගඳ වූ මරණ ස්වභාවය ඇත්තා වූ මේ කය යමෙක් මෙහිදී නොයෙක් ආකාරයෙන් පව් කොට සතුටු කෙරේද, අහෝ පුදුමයකි! ඔවුහු ඒකාන්තයෙන් ම මුළාවූවාහුය.

## 69. ගණ්ඩූපමෙ විවිධරොග නිවාසභූතෙ කායෙ සදා රුධිරමුත්ත-කරීසපුණ්ණෙ යො එත්ථ නන්දති නරො සසිගාලභක්ඛෙ කාමඤ්හි සොචති පරත්ථ සබාලබුද්ධි

සැරව ගෙඩියක් වැනි නා නා රෝගවලට නිවසක් වූ හැමදා ලේ මුත්‍ර අසූචි යන අපිවිතුරු දැයින් පිරුණු සිවලුන් හා බල්ලන් විසින් අනුභව කටයුතු වූ මේ සිරුරේ යමෙක් ඇලීම් වශයෙන් සතුටු වේ ද, අඥාන වූ හේ ඒකාන්තයෙන් පරලොව දී ශෝක කෙරේ ම ය.

## 70. හො ඵෙණපිණ්ඩසදිසො විය සාරහීනො මීළ්හා'ලයො විය සදා පටිකූලගන්ධො ආසීවිසාලය-නිභො සභයො සදුක්ඛො දෙහො සදා සවති ලොණඝටොව භින්නො

පින්වත්නි, පෙණ පිඬක් මෙන් නිස්සාර වූ අසූචි ගෙයක් මෙන් හැමදා පිළිකුල් දුගඳ ඇති, ඝෝර සර්පයන් වසන තුඹසක් බඳු බිය හා දුක උපදවන මේ සිරුර බිඳුණු ලුණු කලයක් මෙන් සැමදා මළ මූත්‍ර වගුරුවන්නේ ය.

**71. ජාතං යථා න කමලං භුවි නින්දනීයං
පඞ්කෙසු හො අසුචිතොය සමාකුලෙසු
ජාතං තථා පරහිතම්පි ච දෙහභූතං
තං නින්දනීයමිහ ජාතු න හොති ලොකෙ**

පින්වත්නි, මේ පෘතුවිය ආශ්‍රිත මඩගොඩක අපිරිසිදු ජලය ඇසුරින් හටගන්නා පියුම නින්දා කළයුත්තක් නොවන්නේ යම් සේ ද, එසේ ම මේ කුණු සිරුර නිසා ඇති වන පරාර්ථ චර්යාව ද, කිසි විට නින්දා කටයුතු නොවන්නේ ය.

**72. ද්වත්තිංස-භාග-පරිපූරතරො විසෙසො
කායො යථා හි නරනාරි ගණස්ස ලොකෙ
කායෙසු කිං ඵලමිහත්ථි ච පණ්ඩිතානං
කාමං තදෙව නනු හොති පරොපකාරං**

ලොකයේ ස්ත්‍රී පුරුෂයන් ගේ කයෙහි ඇති විශේෂය නම්, එය කුණු තිස් දෙකකින් පිරී පැවතීමයි. නුවණැත්තන් හට කයෙන් තිබෙන ඵලය නම් ඒකාන්තයෙන් එය පරාර්ථ චර්යාවේ යෙදවීමයි.

**73. පොසෙන පණ්ඩිතතරෙන තථාපි දෙහො
සබ්බත්තනා චිරතරං පරිපාලනීයො
ධම්මං චරෙය්‍ය සුචිරං බලු ජීවමානො
ධම්මෙ හවෙ මණිවරො ඉව කාමදො හො**

මේ සිරුර දෙතිස් කුණපයෙන් යුක්ත වුවත්, නැණැතියා විසින් එය බොහෝ කලක් රැක්ක යුතු ය. වැඩිකල් ජීවත් වන්නේ ඒකාන්තයෙන් දස කුසල් දහම්හි යෙදෙන්නේ ය. පින්වත්නි, කුසල් දහම් වනාහි සිතුමිණි රුවනක් මෙන් සිතූ පැතූ සැප ගෙන දෙන්නකි.

**74. ඛීරෙ යථා සුපරිභාවිතමොසධම්හි
ස්නෙහෙන ඔසධබලං පරිභාසතෙව
ධම්මො තථා ඉහ සමාචරිතො හි ලොකෙ
ඡායාව යාති පරලොක මිතො වජන්තං**

කිරි හා එක් වූ බෙහෙත් වල ගුණය, ඒ කිරට එක් කළ තෙලටත් යම් සේ ඇද ගන්නේ ද, එසේ ම මෙලොව දී හොඳින් පුරුදු කළ ධර්මය ඔහු මෙලොව සිට පරලොව යන්නා අනුව සෙවනැල්ල මෙන් ගමන් කරයි.

**75. කායස්ස භො විරචිතස්ස යථානුකූලං
ඡායා විභාති රුචිරා'මලදප්පණෙ තු
කත්වා තථෙව පරමං කුසලං පරත්ථ
සම්භූසිතා ඉව භවන්ති ඵලෙන තෙන**

පින්වත්නි, ආභරණයෙන් සරසන ලද ශරීරයාගේ සිත්කළු බව නිර්මල කණ්නාඩියේ දර්ශණීයව යම්සේ බබලයි ද, එපරිද්දෙන් ම මෙලොව දී උතුම් කුසල් කොට, ඒ ආනිසංස හේතු කොට ගෙන සත්වයෝ පරලොව දී මොනවට සරසන ලද අය මෙන් බබලත්.

**76. දෙහෙ තථා විවිධදුක්ඛ නිවාසභූතෙ
මොහා පමාදවසගා සුඛසඤ්ඤමූළ්හා
තික්ඛෙ යථා ඛුරමුඛෙ මධුලෙහමානො
බාළ්හඤ්ච දුක්ඛමනුගච්ඡති හීනපඤ්ඤො**

තියුණු වූ ඇලිපිහි මුවහතෙහි මී පැණි ලෙව කන්නා වූ පුරුෂයා, යම්සේ ඇඩි දුකට පැමිණෙන්නේ ද, එසේ ම මෝහයෙන් නොයෙක් දුකට නිවසක් වූ ශරීරයෙහි සැප ඇතැයි මුලාවට පත් වී ප්‍රමාද වීමෙන්, අඥානයා ද සසර ඇඩි දුකට පත්වන්නේ ය.

**77. සංකප්පරාගවිහතෙ නිරතත්තභාවෙ**
**දුක්ඛං සදා සමධිගච්ඡති අප්පපඤ්ඤො**
**මූළ්හස්ස චෙව සුඛසඤ්ඤමිහත්ථිලොකෙ**
**කිංපක්කමෙව නනු හොති විචාරමානෙ**

කාමයෙන් මත්ව ශරීරයේ ඇළුණා වූ මන්ද බුද්ධික මිනිසා, හැම විට දුකක් ම ලබන්නේ ය. අවිද්‍යාවෙන් මුළා වූ තැනැත්තාට පඤ්චස්කන්ධය සැපයක් ය යන හැඟීම ඇත්තේය. නුවණින් විමසුවොත්, එම සැපය කෑ විගස මැරෙන ඉතා රසවත් "කිම්පක්ක" නම් විෂ අඹ ජාතිය මෙන් නොවන්නේද?

**78. සබ්බො‘පභොග ධනධඤ්ඤවිසෙසලාභී**
**රූපෙන හො ස මකරද්ධජසන්නිභොපි**
**යො යොබ්බනෙපි මරණං ලභතෙ අකාමං**
**කාමං පරත්ථපරපාණහරො නරො හි**

පින්වත්නි, මෙලොවදී යමෙක් පර පණ නසන්නේ ද, ඔහුට පරලොව දී සියළු වස්තූහුද ධනධාන්‍යය ද සැප විශේෂ හා අනංගයෙකුට සමාන රූපයක් ලැබුවත්, සිය කැමැත්තට ඉඳුරා විරුද්ධව තරුණ කාලයේදී ම මිය යයි.

**79. සො යාචකො භවති භින්න-කපාලහත්ථො**
**මුණ්ඩො ධිගක්ඛරසතෙහි ච තජ්ජයන්තො**
**භික්ඛං සදාරිභවනෙ සකුචෙලවාසො**
**දෙහෙ පරත්ථි පරවිත්තහරො නරො යො**

යමෙක් අනුන්ගේ වස්තුව හොර සිතින් ගත්තේ ද, ඒ පව හේතුවෙන් ඔහු පරලොව දී හිස මුඩු කර කබලක් ගත් අත් ඇතිව සියගණන් නින්දා අපහාස වචන වලින් සංග්‍රහ ලබමින් කිළිටි ඇඳුම් ඇඳ සතුරු නිවෙස් වලද හිඟා කන්නේ වෙයි.

**80. ඉත්ථී න මුඤ්චති සදා පුන ඉත්ථිභාවා**
**නාරී සදා භවති සො පුරිසො පරත්ථ**
**යො ආචරෙය්‍ය පරදාරමලඞ්ඝනීයං**
**ඝොරඤ්ච වින්දති සදා ව්‍යසනඤ්ච නෙකං**

යම් ස්ත්‍රියක් පරපුරුෂ සේවනය කලා නම්, ඕ නැවත සැමකල්හි ස්ත්‍රී භාවයෙන් නොමිදෙන්නී ය. ඒ පුරුෂයා පරලොව හැමකල්හි ස්ත්‍රී භාවයට පත්වන්නේය. (ඒ දෙදෙනා ම) පරලොව දී ඝෝර වූ කටුක වූ නොයෙක් ව්‍යසනාදියට පත්වන්නේ ය.

**81. දීනො විගන්ධවදනො ච ජළො අපඤ්ඤො**
**මූගො සදා භවති අප්පියදස්සනො ච**
**පප්පොති දුක්ඛමතුලඤ්ච මනුස්සභූතො**
**වාචං මුසා භණති යො හි අපඤ්ඤසත්තො**

යම් අඥානයෙක් බොරු කියා නම් හෙතෙම පරලොවදී මිනිසත්බව ලදුවත් දුගඳ කටක් ඇති දිළිඳු අඥාන මෝඩයෙක් වෙයි. එසේම නිති ගොළු බවට පැමිණියේ දුටුවන් පිළිකුල් කරන ශරීරාංග ඇත්තේ ද මහත් දුකට පැමිණියේ ද වේ.

**82. උම්මත්තකා විගතලජ්ජගුණා භවන්ති**
**දීනා සදා ව්‍යසනසොක-පරායණා ච**
**ජාතා භවෙසු විවිධෙසු විරූපදෙහා**
**පීත්වා හලාහලවිසං'ව සුරං විපඤ්ඤා**

දරුණු විෂයක් වැනි රහමෙර පානය කරන අඥාන මිනිස්සු පරලොවදී උමතුවෙත්. දුර්ගුණ ඇති විලිබිය නැති දීන බැගෑපත් අය වෙත්. නොයෙක් භවයන්හි ඉපදුණු කල්හිදු බොහෝ දුක් විපත් ලැබ විරූපත්වයට ද පත්වෙයි.

## 83. පාපානි යෙන ඉහ ආචරිතානි යානි
## යො වස්සකොටි-නහුතානි අනප්පකානි
## ලද්ධාන ඝොරමතුලං නරකෙසු දුක්ඛං
## පප්පොති චෙත්ථ විවිධව්‍යසනඤ්ච නෙකං

යමෙකු විසින් මෙලොවෙහි දී බොහෝ පාපකර්ම කරන ලද ද, හේ පරලොවදී (සංජීවාදී) නරකයන්හි කෙළ නහුත ගණන් අවුරුදු අපමණ කටුක දුක් අනුභව කොට (නැවත) මෙලොවෙහිදී ද අනේකවිධ ව්‍යසනයන්ට පැමිණෙන්නේ ය.

## 84. ලොකත්තයෙසු සකලෙසු සමං න කිඤ්චි
## ලොකස්ස සන්තිකරණං රතනත්තයෙන
## තං තෙජසා සුමහතා ජිතසබ්බපාපො
## සොහං සදා'ධිගත-සබ්බසුඛො භවෙය්‍යං

මුලු තුන්ලොවෙහි රත්නත්‍රය හා සමාන ලෝකයා හට ශාන්තිකර වූ කිසිවක් නැත්තේ ය. අතිශයින් මහත් වූ ඒ රත්නත්‍රයේ තේජසින් මම නසන ලද පාපයන් ඇත්තේ ලෝකෝත්තර සැප ලබම්වා.

## 85. ලොකත්තයෙසු සකලෙසු ච සබ්බසත්තා
## මිත්තා ච මජ්ඣ-රිපු-බන්ධුජනා ච සබ්බෙ
## තෙ සබ්බදා විගතරොගභයා විසොකා
## සබ්බං සුඛං අධිගතා මුදිතා භවන්තු

මුළු තුන්ලොව යම්තාක් සියලු සත්වයෝ ද හිත-අහිත-මැදහත් සත්වයෝ ද ඤාති ජනයා ද යන ඒ සියල්ලෝ ම රෝග ශෝක භය නැත්තෝ වෙත්වා. ප්‍රීති ප්‍රමෝදයෙන් යුක්ත වූවාහු සියලු සැප ලබත්වා.

**86. කායො කරීසභරිතො විය භින්නකුම්භො**
**කායො සදා කලිමලව්‍යසනාධිවාසො**
**කායෙ විභඞ්ඛදති ච සබ්බසුඛන්ති ලොකො**
**කායො සදා මරණරොගජරාධිවාසො**

මේ ශරීරය අශුචි පිරුණු බිඳුණු කළයක් වැනි ය. හැම කල්හිම පාප මලයට හා විපතට නිවසක් වැනි ය. ලෝක සත්ව තෙමේ කයෙහි සියලු සැප ඇතැයි සිතා වැනසේ. එහෙත් මේ කය හැමකල්හිම ජරා-මරණ-රෝග යන මොවුන්ට නිවසක්ම වෙයි.

**87. සො යොබ්බනොති ථවිරොති ච බාලකොති**
**සත්තෙ න පෙක්ඛති විභඞ්ඛදතිරෙව මච්චු**
**සොහං ඨිතොපි සයිතොපි ච පක්කමන්තො**
**ගච්ජාමි මච්චුවදනං නියතං තථා හි**

හෙතෙමේ තරුණයි. හේ වයෝවෘද්ධයි. හේ බාලයැයි කිසිදු සත්ව විශේෂයක් නොබලා මාරයා සත්වයන් පෙළන්නේ ම ය. එසේ ම මම ද සිටියේ, නිදාගත්තේ, යන්නේ (ආදී සිව් ඉරියව්වෙහි) ඒකාන්තයෙන් මරුමුව කරා යන්නේම ය.

**88. එවං යථා විහිතදොසමිදං සරීරං**
**නිච්චං'ව තග්ගතමනා හදයෙ කරොථ**
**මෙත්තං පරිත්තමසුභං මරණස්සතිඤ්ච**
**භාවෙථ භාවනරතා සතතං යතත්තා**

සිරුරෙහි මේ කියන ලද, දොස් දැනගත් තෙපි නිති ඒ ගැන මෙනෙහි කරවු. එසේ ම සන්සුන් සිත් ඇතිව භාවනාවෙහි ඇලී මෛත්‍රී භාවනාව ද, පිරිතද (බුදුගුණ ආදී භාවනා ද), අසුභ භාවනාව ද, මරණානුස්සති භාවනාව ද නිතර වඩවු.

## 89. දානාදි පුඤ්ඤකිරියානි සුඛුද්‍රයානි
## කත්වා ච තම්ඵලමසෙසම්හප්පමෙය්‍යං
## දෙය්‍යං සදා පරහිතාය සුඛාය චෙව
## කිම්භො තදෙව නනු හත්ථගතඤ්හි සාරං

සැපතට පමුණුවන්නා වූ දානාදී පින්කම් මෙනෙහි කොට, සත්වයෝ ප්‍රමාණයක් නැති සැප අනුභව කෙරෙත්. හැමදාම අන් අයට හිතසුව පිණිස දන් දිය යුතුයි. පින්වත එයම ඔබගේ හස්තසාර වස්තුවක් නොවේ ද?

## 90. හෙතුං විනා න භවතී හි ච කිඤ්චි ලොකෙ
## සද්දොව පාණිතල-ඝට්ටන-හෙතුජාතො
## ඵවඤ්ච හෙතුඵල භාවවිභාගභින්නො
## ලොකො උදෙති ච විනස්සති තිට්ඨතී ච

පින්වතුනි, ලොව කිසිවක් හේතු රහිතව නොවේ ම ය. අත්පුඩි ගැසීමෙන් ශබ්දය ඇතිවන්නාක් මෙනි. මෙසේ හේතු ඵල විභාග වශයෙන් බෙදුණු මේ ලෝකය ඉපදී පැවතී විනාශ වන්නේය.

## 91. කම්මස්ස කාරණාමයඤ්හි යථා අවිජ්ජා
## හො කම්මනා සමධිගච්ඡති ජාතිභෙදං
## ජාතිං පටිච්ච ච ජරාමරණාදිදුක්ඛං
## සත්තා සදා පටිලභන්ති අනාදිකාලෙ

පින්වත්නි, යම් සේ අවිද්‍යා තොමෝ කුසලාකුසල කර්මයට මුල් වේ ද එසේ ම කුසලාකුසල කර්ම හේතුකොටගෙන කැත් බමුණු ගොවි ආදී ජාති භේදයට සත්වයා පැමිණේ. ජාතිය නිසා හෙවත් විවිධ භේද, ඇති උප්පත්තිය නිසා කෙළවරක් නැති කාලයක සිට සත්ත්වයෝ ජරා මරණාදි දුක්වලට පැමිණෙති.

**92. කම්මං යථා න භවතීහ ච මොහනාසා
කම්මක්ඛයාපි ච න හොති භවෙසු ජාති
ජාතික්ඛයා ඉහ ජරාමරණාදිදුක්ඛං
සබ්බක්ඛයො භවති දීප-ඉවානිලෙන**

මෙහිලා යම් සේ අවිද්‍යාවගේ නැසීමෙන් කුසලාකුසල කර්ම ඉපදීමේ ශක්තිය නැති වේ ද, එසේ ම කර්ම ක්ෂය වීම හේතුකොටගෙන ජාතිය හෙවත් උත්පත්තිය නවතී. උපත නැවතීමෙන් ජරා මරණාදීහු නැවත කවදාවත් ම නො උපදිති. මාරුත වේගයෙන් පහන නිවී යන්නාක් මෙනි.

**93. යො පස්සතීහ සතතං මුනිධම්මකායං
බුද්ධං ස පස්සති නරො ඉති සො අවොච
බුද්ධඤ්ච ධම්මමමලඤ්ච තිලොකනාථං
සම්පස්සිතුං විචිනථා'පි ච ධම්මතං හො**

පින්වත්නි, මේ ලෝකයෙහි යමෙක් නිතර බුදුන්ගේ ධර්මකාය හෙවත් අසූහාරදහසක් ධර්මස්කන්ධය දැන ඊට අනුව ජීවත් වේ ද, ඔහු ඒකාන්තයෙන් බුදුන් දකීයැයි බුදුන් වහන්සේ වදාළහ. එබැවින් තුන්ලොවට පිහිට වූ බුදුරජාණන් වහන්සේ ද, නිර්මල වූ ධර්මය ද දැකීමට (සීලාදී) ධර්මයන් රැස් කරවු.

**94. සල්ලං'ව හො සුනිසිතං හදයෙ නිමුග්ගං
දොසත්තයං විවිධපාපමලෙන ලිත්තං
නානාවිධ-බ්‍යසන-භාජනමප්පසන්නං
පඤ්ඤාමයෙන බලිසෙන නිරාකරොථ**

පින්වත්නි, ඉතා තියුණු පපුවේ ඇණුනු උලක් බඳු, නොයෙක් පාප නැමැති අසූචියෙන් ආලේප කරන ලද්දා වූ නන්වැදැරුම් විපත් වලට භාජනය වූ ද, කිලුටු වූ ද, රාග දෝස මෝහ නැමැති උල නුවණ නැමැති බිලී කටුවෙන් ඉවත් කරවු.

**95. නාකම්පයන්ති සකලාපි ච ලොකධම්මා**
**චිත්තං සදා'පගත-පාපකිලෙස-සල්ලං**
**රූපාදයො ච විවිධා විසයා සමග්ගා**
**වුට්ඨිං'ව මෙරුසිඛරං මහතා'නිලෙන**

මහා සුළඟකින් මහා මේරු මුදුන කම්පා කරන්නට යම් සේ බැරිවේ ද, එසේ ම සියලු අටලෝ දහම්හු ද නන්වැදැරුම් රූප ශබ්ද ආදී සියලු පංචකාම වස්තූහු ද හැමකල්හි ඉවත්කරන ලද කෙලෙස් නැමැති උල් ඇති රහතන් වහන්සේගේ සිත කම්පා නො කෙරෙත්.

**96. සංසාර-දුක්ඛමගණෙය්‍ය යථා මුනින්දො**
**ගම්භිරපාරමිත සාගරමුත්තරිත්වා**
**ඤෙය්‍යං අබොධි නිපුණං හතමොහජාලො**
**තස්මා සදා පරහිතං පරමං චිණාථ**

බුදුරජාණන් වහන්සේ සසර දුක් ගණනකට නොගෙන ගැඹුරු පාරමිතා නමැති සාගරයෙන් එතෙරව නසන ලද මෝහ දැල් ඇත්තේ සියුම් වූ ඤෙයය මණ්ඩල අවබෝධ කළ සේක. එහෙයින් හැමකල්හි පරාර්ථය පිණිස උතුම් කුසලය ම රැස්කරවු.

**97. ඔභාය සො'ධිගත-මොක්ඛසුඛං පරෙසං**
**අත්ථාය සංචරි භවෙසු මහබ්භයෙසු**
**එවං සදා පරහිතං පුරතො කරිත්වා**
**ධම්මො මයානුචරිතො ජගදත්ථමෙව**

ඒ සර්වඥ තෙම අතට පත් නිවන්සුව හැර මහ බිය උපදවන භවයන්හි ඉපදී යම් පරාර්ථ චර්යාවක් කළේ ද, මෙසේ මා විසින් හැමකල්හිම පරාර්ථය ම පෙරදැරි කොට ලෝකයාට හිතවැඩ පිණිස ධර්මයෙහි ම හැසිරෙන ලදී.

## 98. ලද්ධාන දුල්ලභතරඤ්ච මනුස්සයොනිං
## සබ්බං පපඤ්චරහිතං ඛණසම්පදඤ්ච
## ඤත්වාන ආසවනුදෙකහිතඤ්ච ධම්මං
## කො පඤ්ඤවා අනවරං න භජෙය්‍ය ධම්මං

ඉතා දුක සේ ලැබිය යුතු වූ මිනිසත් බව හා ප්‍රමාදභාවයෙන් තොර ක්ෂණ සම්පත්තිය ලැබ, කෙලෙසුන් නැසීමේ එකම හිතවතා වූ ධර්මය ද දැනගෙන කවරනම් නැණවතෙක් ධර්මයෙහි නිරතුරුව නො හැසිරෙන්නේ ද?

## 99. ලද්ධාන බුද්ධසමයං අතිදුල්ලභඤ්ච
## සද්ධම්ම මග්ගමසමං සිවදං තථෙව
## කල්‍යාණමිත්තපවරෙ මතිසම්පදඤ්ච
## කො බුද්ධිමා අනවරං න භජෙය්‍ය ධම්මං

ඉතා දුලබ බුදුසමය අසම වූ නිවන් ගෙනදෙන ශ්‍රේෂ්ඨ ශ්‍රී සද්ධර්මය, එසේ ම කලණ මිතුරන් හා නුවණ ද ලැබගෙන කිනම් නැණවතෙක් ධර්මයෙහි නිරතුරුව නො හැසිරෙන්නේ ද?

## 100. එවම්පි දුල්ලභතරං විභවෙ සුලද්ධා
## මච්ඡෙරදෙස විරතා උභයත්ථකාමා
## සද්ධාදිධම්මසහිතා සතතප්පමත්තා
## භො භො කරොථ අමතාධිගමාය පුඤ්ඤං

පින්වත්නි, පින්වත්නි, මෙබඳු දුර්ලභතර බුදු සමය, ක්ෂණසම්පත් ආදී සැප ලැබගෙන මසුරු දොස් රහිත ව එලොව මෙලොව හිත වැඩ පිණිස ශ්‍රද්ධාදී ධර්ම සහිතව නිරන්තරයෙන් නොපමාව නිවන්සුව අවබෝධය පිණිස පින් කරවු.

සාධූ! සාධූ! සාධූ!